# ආශ්චර්යමත් ආර්ථිකයක් සඳහා කුළුබඩු උද්‍යාන

ශ්‍රී ලංකාවේ කුළුබඩු සම්බන්ධයෙන් ඇත්තේ ඉතා ඈත ඉතිහාසයකි. රාජ්‍යය, වියළි කලාපයෙන් රටේ නිරිතදිග කලාපයට සංක්‍රමණය වීමෙන් පසු විශේෂයෙන් ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, සීතාවක, මහනුවර වැනි යුගවල රජවරුන් විදේශ රටවල් සමග වෙළෙඳ කටයුතු පවත්වාගෙන ගොස් ඇති අතර එහි දී ශ්‍රී ලංකාවේ කුළුබඩු අතිශය වැදගත්කමක් ගෙන තිබුණි. පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම එකල ශ්‍රී ලංකාව සමග වෙළෙඳ සබඳතා පැවැත් වූ ප්‍රධාන විදේශ නියෝජිතයා විය. එකළ කුළුබඩු අතර කුරුඳු අතිශය වැදගත් කමකින් යුක්ත විය. ශ්‍රී ලංකාවේ කුළුබඩු ඇතුළු වෙළඳ ද්‍රව්‍යවල එකල තිබූ වැදගත්කම මත පෘතුගීසි, ලන්දේසි හා පසුව ඉංග්‍රීසින් ද ශ්‍රී ලංකාව තුළ තම පාලනය ස්ථාපිත කිරීමටත් ස්වකීය පාලන තන්ත්‍රයන් මෙරට බිහි කිරීමටත් පියවර ගත් හ.

ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය භූගෝලීය විවිධත්වය හා දේශගුණය අනුව රටතුළ කුළුබඩු බෝග ඉතා හොඳින් වගා කෙරෙන ප්‍රදේශ රාශියක් පිහිටා ඇත. මේ අනුව, මධ්‍යම පලාතේ මහනුවර, මාතලේ දිස්ත්‍රික්කය, සබරගමුව පලාතේ කෑගල්ල හා රත්නපුර දිස්ත්‍රික්ක, වයඹ පලාතේ කුරුණෑගල දිස්ත්‍රික්කය, දකුණු පලාතේ ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක, බස්නාහිර පලාතේ කොළඹ, ගම්පහ, කළුතර දිස්ත්‍රික්ක යන ප්‍රදේශයන් හි පස හා දේශගුණය කුළුබඩු වගාව සඳහා සුදුසු තත්ත්වයක පවතී.

ශ්‍රී ලංකාව යටත් විජිත යුගයෙන් නිදහස ලබාගත් 1948 සහ 1950 ගණන්වල ශ්‍රී ලංකාවේ බිහි වූ රජයන් විශේෂ අවධානයක් යොමුකලේ වී වගාව ප්‍රමුඛ කොටගත් දේශීය ආහාර බෝගයන්ගෙන් රට ස්වයං පෝෂිත කිරීම සඳහා ය. යටත් විජිත සමයේ දී විදේශිකයන් විසින් මේ රටේ ඇති කරන ලද තේ, පොල්, රබර් යන ප්‍රධාන වැවිලි ආර්ථිකය විසින් රටට විදේශ විනිමය උපයාදීම සිදුවිය. එසේ වුව ද, 1970 දශකයේ ලෝක ආර්ථික අවපාත හා උද්ධමනය හේතුවෙන් ශ්‍රී ලංකාවට, ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දීමට සිදු වූ අතර ශ්‍රී ලංකාවේ ආර්ථික සංයෝගයේ මුහුණුවර වෙනස් කිරීම සඳහා විවිධ ක්‍රියාමාර්ග වලට එළඹිණි. තව ද, කෘෂි ආර්ථිකය විවිධාංගීකරණයට ලක් කිරීම සඳහා වූ ප්‍රතිපත්ති අනුගමනය කරනු ලැබී ය. ඒ අනුව, අතීතයේ දී, අතිශය වැදගත් කමක් ඉසිලූ, පසු කලෙක යටපත් ව තිබූ කුළුබඩු ආර්ථිකය, සුළු අපනයන බෝග නමින් යළිත් ඔසවා තැබීමක් සිදු විය. මේ කාලය තුළ අපනයන වෙළෙඳපළේ ශ්‍රී ලංකාවේ කුළු බඩු සඳහා ඉහළ මිලක් ලැබුණ නිසා එම බෝග වගාව දිරිමත් කිරීම සඳහා ආධාර ක්‍රම ආදී සානුබල හඳුන්වාදෙනු ලැබී ය.

කුළුබඩු යනු ආහාර කල්තබා ගැනීමට භාවිතා කල හැකි අමුද්‍රව්‍ය ක්, ආහාර රසවත් කරන හා පෝෂණය පහසුකරන කාරකයක්, සුවඳ විලවුන් සෑදීමේ ස්වභාවික අමුද්‍රව්‍යයක්, හා ඖෂධයක් ලෙස බටහිර ජාතීන්ගේ සම්භාවනාවට පාත්‍ර වී තිබුනේ 17 වන ශත වර්ෂයටත් පෙර සිට ය. එම නිසා, ශ්‍රී ලංකාවේ ස්වභාවිකව වැවෙන කුළුබඩුවලට මහත් ආශාවක් දැක් වූ බටහිර ජාතීන් ශ්‍රී ලංකාව මැණික් දිවයිනක් සේ සලකන්නේ යම්සේ ද, කුළුබඩු දිවයිනක් සේ සැලකීමට ද, ඒවා පිළිබඳව වැඩිදුරටත් හාරා ඇවිස්සීමට එම බෝග වගාවන ගස්වැල් ආදිය නැරඹීමටත්, ඒවා ස්පර්ශ කිරීමටත් අභිරුචියක් දක්වන්නට විය. සංචාරකයන් ලෙස මෙරටට පැමිණෙන බටහිර ජාතීන් කුළුබඩු වගාව පැවති වගා බිම්වල ඇවිදීමට ද මහත් ආශාවක් හා උනන්දුවක් දැක්වී ය. මේ පිළිබඳව අළුත් අදහස්වලින් යුත් උඩරට මාතලේ ප්‍රදේශයේ ව්‍යාපාරිකයෙකු විසින් 1975 වර්ෂයේ දී කුළුබඩු උද්‍යානයන් (ඩඩිසපු ඡ්වීක්වඨ–ළුක්) ආරම්භ කරන ලද අතර ව්‍යාපාරිකයින් ගණනාවක් ක්‍රම ක්‍රමයෙන් මෙම ක්ෂේත්‍රයට අවතීර්ණ විය.

කුළුබඩු උද්‍යානය එක් අතකින් කුළුබඩු හා ඖෂධ ශාක හා එහි නිෂ්පාදන හඳුන්වාදෙන, පිළිවෙලකට සකස්කල උද්භිද උද්‍යානයක් මෙන් ම ජෛව විවිධත්වය එක්තැන් කල ආදර්ශ පරිසර සංරක්ෂණ ඒකකයක් ලෙස ද නිර්වචනය කිරීමේ වරදක් නැත.

වර්තමානයේ ශ්‍රී ලංකාවේ කුළුබඩු උද්‍යාන (Spice garden) පිහිටි ප්‍රධාන ප්‍රදේශ දෙකක් ඇත. එනම් කෑගල්ල දිස්ත්‍රික්කයේ මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උතුවන්කන්දේ සිට මාවනැල්ල දක්වා කොළඹ නුවර මහා මාර්ගය දෙපස හා මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ සහ පල්ලෙපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ දෙකේ මාතලේ – දඹුල්ල ඒ 9 මාර්ගය දෙපස පිහිටි පලාපත්වල, දොරකුඹුර, කිරිගල් පොත්ත, මකුල්ගහරුප්ප, කවුඩුපැලැල්ල, මඩවල උල්පත යන ග්‍රාම නිලධාරී වසම් තුළ ය. මෙම කුළු බඩු උද්‍යාන තුළ ගම්මිරිස්, කුරුඳු, එනසාල්, සාදික්කා, කරාබු, ගොරක, කහ, ඉඟුරු, වැනිලා යන කුළුබඩු බෝග ද, අරළු, බුලු, කෝමාරිකා, කොහොඹ, මරතොන්ඩි, සුදුහඳුන්,

කරපිංච, සේර, තෙඹු, අරත්ත, නවහන්දි, රසකිඳ, ඉරමුසු, පොල්පලා, හාතවාරිය යන ඖෂධ ශාක ද, අන්නාසි, කෙසෙල්, වැල, වරකා, අඹ, ජම්බු, පේර, අලිපේර මල්බෙරි, දොඩං, ජම්බෝල, නාරං, වැනි පළතුරු ශාක ද, වැටකේ, ෆාම්ගස්, නා ගස්, එරබදු ගස් වැනි අලංකාර ගස් වර්ග ද, සපු, මිල්ල, මහෝගනී, එනු මිදෙල්ල යන දැව ගස් ද, රටදෙල්, වල්දෙල්, පොල්, පුවක්, බුලත් යන ශාක ද මෙම උද්‍යාන තුළ වගාකොට ඇත. 1975 දී පමණ පැරඩයිස් නමින් පළමුවන කුළුබඩු උද්‍යානය මාතලේ තොටහමුව නමැති ගම්මානයේ දී බිහි වී ඇති අතර වර්තමාණය වනවිට උද්‍යාන 18ක් ක්‍රියාත්මක වෙමින් පවතී. මෙම උද්‍යාන අරඹා වසර 35ක පමණ දිගු කාලයක් ගත වී ඇති නිසා උද්‍යානවල සියළුම ගස් සහ වැල් හොඳින් වැඩී පරිනත තත්ත්වයට පත් වී තිබේ.

### අභ්‍යන්තර සාමය හා කුළුබඩු උද්‍යාන ව්‍යාපාරය

මෙම කුළුබඩු උද්‍යාන විදේශීය විශේෂයෙන්ම බටහිර සංචාරකයන් මත ම යැපෙන නිසා එහි යහ පැවැත්මට ලෝක දේශපාලන ස්ථාවරභාවය, යහපත් දේශගුණික සාධක සහ ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සාමය යන කරුණු බෙහෙවින්ම බලපායි. මෙම උද්‍යාන මෙතෙක් පසුකර පැමිණි ගමන් මග විමසා බලන විට 1980 ගණන් වන විට රටේ ආර්ථික හා දේශපාලන ස්ථාවරත්වය මත ඉතා හොඳින් පවත්වාගෙන ගොස් ඇති බව පෙනී යයි. කුළුබඩු උද්‍යාන සංඛ්‍යාව සියයක් තරම් දක්වා ව්‍යාප්ත වී තිබේ. 1991 වර්ෂයේ දී ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය කුළුබඩු උද්‍යාන සමග සම්බන්ධ වීම මත මෙම ව්‍යාපාරය තවදුරටත් පුළුල් වී ඇත. කෙසේ වුවත්, 1983 ජුලි කලබලය, 1989 භීෂණ සමය වැනි අභ්‍යන්තර සිවිල් අරගල මෙම ව්‍යාපාරයේ දියුණුව සීමා කිරීමට හේතු වුවද ව්‍යාපාරය කඩා වැටුනේ නැත. මෙම කාල පරිච්ඡේදයේ දී උතුරේ යුද්ධය පැවතුන ද, මෙරටට සංචාරකයන්ගේ පැමිණීම හොඳින් සිදු වූ නිසා කුළුබඩු උද්‍යාන ද ගැටළුවකින් තොරව පවත්වාගෙන යාමට හැකි විය. මේ ආකාරයට 2001 වර්ෂය තෙක් මෙම ව්‍යාපාරය ඉතා හොඳ තත්ත්වයකින් පවත්වාගෙන යාමට හැකි විය. 1995 වර්ෂයේ දී කළුබඩු වතු හිමියන්ගේ සංගමයක් පවා පිහිටුවා ගනු ලැබී ය. උතුරේ යුද්ධය හා සමගාමීව 2002 වර්ෂය වනවිට, කටුනායක ගුවන්තොටුපළට ප්‍රහාර එල්ල කිරීම හා ශ්‍රී ලංකාව සංචාරයට නුසුදුසු තැනක් ලෙස ප්‍රකාශයට පත්වීමත් සමග 2002 වර්ෂයේ දී, මෙම ව්‍යාපාරය බොහෝ සෙයින් අඩපන වී ගියේ ය. යළිත් සංචාරක ව්‍යාපාරය ක්‍රමයෙන් වර්ධනය වීමත් සමග කුළුබඩු උද්‍යාන ද, ක්‍රමයෙන් වර්ධනය වූ අතර සුනාමි ව්‍යසනයත් සමග සංචාරක ව්‍යාපාරයේ බිඳවැටීම සිදු විය. සංචාරක ව්‍යාපාරය යළිත් අඩපන විය. ශ්‍රී ලංකාවේ උතුරු - නැගෙනහිර යුධ තත්ත්වය සම්පූර්ණයෙන් අවසන් වී යළිත් ශ්‍රී ලංකාව සුරක්ෂිත රටක තත්ත්වයට පත්වීමත් සමග සංචාරක කර්මාන්තය ද ප්‍රවර්ධනය වෙමින් පවතී. කුළු බඩු උද්‍යාන ද යළිත් නව පිබිදීමක් ලබා තිබේ. එසේ වුව ද, වර්තමානයේ මෙම තත්ත්වය යටතේ ද කුළුබඩු උද්‍යානවලට ප්‍රබල ගැටළුවකට මුහුණපාන්නට සිදු වී ඇත. එනම්, 2010 සහ 2011 කාලය තුළ සංචාරක හෝටල්වල බදු වැඩිකිරීම නිසා හෝටල් ගාස්තු ඉහළ යාම යි. මේ නිසා යුරෝපීය සංචාරකයන් මාලදිවයින් වැනි ලාභ සංචාරක රටවල් කරා ඇදීයාමක් දක්නට ලැබේ. මේ නිසා ද, කුළු බඩු උද්‍යාන නැරඹීමට එන සංචාරකයින්ගේ පැමිණීම අඩුවක් දක්නට ඇති බවත්, එය මෙම කර්මාන්තයේ ප්‍රගතියට මහත් බාධයක් වී ඇති බවත්, ඒ පිළිබඳව විමසුමක දී හෙළිවිය.

### වර්තමානයේදී කුළුබඩු ආශ්‍රිත ව්‍යාපාර මුහුණ දී සිටින ගැටළු

කුළුබඩු උද්‍යාන හිමියන් සමග සාකච්ඡා කරන විට වර්තමානයේ ඔවුන් මුහුණ දී සිටින ප්‍රධාන ගැටළුව ලෙස දක්වන ලද්දේ ප්‍රමාණවත් ආදායමක් ව්‍යාපාරයට නො ලැබීමයි. එලෙස ප්‍රමාණවත් ආදායමක් නො ලැබීමට හේතු වී ඇත්තේ කුළුබඩු උද්‍යාන නැරඹීම සඳහා සංචාරකයන්ගේ පැමිණීමේ අඩුකමයි. වර්තමානයේ ශ්‍රීලංකාවේ සංචාරය කිරීම සඳහා පැමිණෙන සංචාරකයින්ගෙන් සැලකිය යුතු පිරිසක් ආසියාතිකයන් ය. ආසියාතිකයින්ට කුළුබඩු බෝග එතරම් සිත් ඇලවීමට හේතුවක් නැත්තේ ඔවුන්ගේ රටවල මේවා වගාවන බැවිනි. එසේ වුව ද, යුරෝපීය සංචාරකයන් වැඩි වශයෙන් පැමිණෙන්නේ නම් ඔවුන් ශ්‍රී ලංකාවේ කුළුබඩුවලට මෙන් ම ශාක පදනම් කර ගත් ඖෂධවලට කැමැත්තක් දැක්වීම නිසා ඔවුහු කුළුබඩු උද්‍යාන නැරඹීමට අභිරුචියක් දක්වති.

ප්‍රමාණවත් ආදායමක් ඉපදවීමට අසමත්වීම නිසා සේවක මණ්ඩලවලට වැටුප් ගෙවීමට හා වෙනත් සේවක සුබසාධන කටයුතු පවත්වාගෙන යාම කුළු බඩු කර්මාන්තයේ යෙදී සිටින්නන්ට ප්‍රශ්නයක් වී ඇත. එමනිසා, පලපුරුදු සේවක මණ්ඩලයක් පවත්වා ගෙනයාම අසීරු වී තිබේ. කුළුබඩු උද්‍යානය තුළ ඇති භූමිය සහ ගස්වැල් හොඳින් නඩත්තු කළ යුතු අතර එය පිරිසිදුව පවත්වාගෙන යා යුතු ය. එසේ වුව ද, ආදායම් අඩුවීම වතු නඩත්තුව දුර්වල කිරීමට හේතු වන්නකි. වතු නැරඹීම සඳහා පැමිණෙන සංචාරකයන්, වැසිකිලි, සේදුම් කාමර ආදිය ඉතා අනර්ඝත්වයකින් යුක්තව පවත්වාගෙන යා යුතු ය. ආදායම අඩුවීම් තත්ත්වය මත එවැනි පහසුකම් ඉහළ මට්ටමකින් පවත්වාගෙන යාම ගැටළු ඇතිකරන්නකි. සංචාරකයින් සඳහා අවශ්‍ය සේවා සැපයීම සඳහා විදේශීය භාෂාවන් කිහිපයක්ම කථා කිරීමේ හැකියාව කාර්ය මණ්ඩලවලට තිබිය යුතු ය. එවැනි භාෂා නිපුනතාවකින් හෙබි පුද්ගලයන් මෙම කර්මාන්තය තුළ රඳවා ගැනීමේ අපහසුවක් පවතී. එමනිසා, විදේශීය භාෂාවන් කිහිපයක් ම චතුර ලෙස

කථාකල හැකි භාෂා නිපුනතා මධ්‍යස්ථානයක් මගින් මෙම අවශ්‍ය භාෂා නිපුනත්වයකින් යුත් පුද්ගලයන් බිහිකිරීම මෙම කර්මාන්තයේ දියුණුවට හේතු වේ.

**නිගමනය**

කුළුබඩු උද්‍යාන ව්‍යාපාර රජයේ වියදමක් හෝ වැඩි උදව්වක් නොමැතිව පෞද්ගලික ව්‍යාපාරික මහතුන් කිහිපදෙනෙකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාරයකි. එසේ වුව ද, එමගින් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය සහ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය වීමට ද, ශ්‍රී ලංකාවේ කුළුබඩු යුරෝපා වෙළෙඳපළ තුළ ජනප්‍රිය වීමට ද හේතු වන්නකි.

එමනිසා, වැඩි වශයෙන් සංචාරකයින් ආකර්ශනය කර ගැනීම සඳහා කුළුබඩු උද්‍යාන ව්‍යාපාරය සම්බන්ධ ප්‍රචාරණය අතිශයින්ම වැදගත් ය. ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලය මෙන් ම පෞද්ගලික සංචාරක ඒජන්සි ආයතන විසින් ද කළුබඩු උද්‍යාන ක්ෂේත්‍රය සම්බන්ධ ප්‍රචාරණය තවදුරටත් පුළුල් කිරීමත්, සංචාරකයන් සඳහා වූ හෝටල් සම්බන්ධයෙන් බදු ප්‍රතිපත්තිය ලිහිල් කිරීම මගින් අඩු හෝටල් ගාස්තු යටතේ සංචාරකයන්ට මෙරටට පැමිණ නවාතැන් ගැනීමට පහසුකම් සැලසීමත්, මෙම කළුබඩු උද්‍යාන ක්ෂේත්‍රයේ දියුණුවට රජය පැත්තෙන් ඉටුවිය යුතුකම වන්නේ ය. එය කුළුබඩු, කුළුබඩු නිෂ්පාදන, දේශීය ඖෂධ පැළෑටි හා ඖෂධ නිෂ්පාදන පරිසර සංරක්ෂණය හා මිනිසාගේ සෞඛ්‍ය වැනි ක්ෂේත්‍ර ගණනාවක් එකට එක් වූ දේශීයත්වය ප්‍රවර්ධනය කෙරෙන ව්‍යාපාරයක් තුළින් ශ්‍රී ලංකාවේ ආශ්චර්යය ලොවට බෙදාදෙන තෝතැන්නක් වන්නේ ය.


**ආර්.එල්.එන්. ජයතිස්ස**

*සහාය අධි පර්යේෂක*

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය


## 'ගොවි ජනතා' - ඉදිරි කලාප...

පාඨක ඔබගේ ඉල්ලීම් සලකා බලා 'ගොවි ජනතා' සඟරාවේ ඉදිරි කලාපයන් හී ලිපි, නිර්මාණ මෙන් ම ඔබගේ වටිනා අදහස් හා යෝජනාවන්ට ඉඩක් වෙන් කරන්නට අපි සිතුවෙමු. ඊට ඔබට ද දායක විය හැකි ය. ඔබගේ ලිපි නිර්මාණයන් $A_4$ තනිපිටුවෙහි ලියා පහත සඳහන් ලිපිනයට අප වෙත ලැබෙන්නට සලස්වන්න.


**සංස්කාරක**
**ගොවි ජනතා**
**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**
**114, විජේරාම මාවත,**
**කොළඹ - 07**

දුරකතන: 011-2696981, 2698539-41 දිගුව: 281